**අඩඩාලවෙනෙයි ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අඩඩාලවේනෙයි ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අඩඩාලවෙනෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**
**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන්ට සහ සාමාජිකයන්ට ගෙවනු ලැබූ වැටුප් හා දීමනා එකතුව රු.2,780,964 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ඉහත කරුණ නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ වැඩ අවසන් කළ රු. 9,862,329ක් වටිනා ඉදිකිරීම් 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | මෝටර් ග්‍රේඩරය සහ රෝලරය කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී ලැබිය යුතු රු.226,790 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.8,091,768 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.13,654,109 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා දෙසැම්බර් මාසයේ සෘජුවම බැංකුවට ලැබුණු | පැහැදිළි විස්තර නොමැතිකම හේතුවෙන්, සමාලෝචිත | වර්ෂයට අදාළ ආදායම් හඳුනාගෙන එම අවස්ථාවේම |

රු.11,743,147 ක මුද්දර ගාස්තු වර්ෂයේදී ගැලපීම් කළ ගිණුම්ගත කළ යුතුය. ගිණුම්ගත නොකර හඳුනා නොගත් නොහැකි අතර 2023.01.01 ලැබීම් ලෙස බැංකු සැසඳුම් දින ආදායමට ගත් බව. ප්‍රකාශනයේ දක්වා තිබුණි..

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 350,000 | 146,200 | 146,200 | - | 800,000 | 130,380 | 130,380 | - |
| ii. | කුලී | 11,960,000 | 9,954,669 | 8,583,869 | 1,370,800 | 2,860,000 | 7,714,108 | 7,709,358 | 394,050 |
| iii. | බලපත්‍ර ගාස්තු | 1,542,000 | 757,475 | 757,475 | - | 1,592,000 | 866,200 | 866,200 | - |
| iv. | වෙනත් ආදායම් | 15,930,000 | 15,769,748 | 13,698,423 | 2,071,324 | 23,280,000 | 6,940,665 | 16,982,639 | 801,840 |
| | එකතුව | 29,782,000 | 26,628,092 | 23,185,967 | 3,442,124 | 28,532,000 | 15,651,353 | 25,688,577 | 1,195,890 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ හා අයිතීන් බදු දීමෙන් ලැබිය යුතු ශේෂය රු.1,169,750 ක් වූ අතර ඉන් රු.273,300 ක් වර්ෂ 07 කට අධික කාලයක සිට හිඟහිටව පැවැතුණි. | හිඟහිටි නොගෙවන පුද්ගලයින් හඳුනාගත නොහැකිව පවතින බැවින් කපා හැරීමට කටයුතු කළ බව. | අය කළ යුතු ආදායම් කඩිනමින් අය කිරීමට හෝ නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| **(ආ) වෙළෙඳ බලපත්‍ර** | | |
| සමාලෝචිත වර්ෂයේ සභාවේ බල ප්‍රදේශයේ වෙළෙඳ බලපත්‍ර ලබානොගත් වෙළඳ ව්‍යාපාර 1,043ක් සඳහා වෙළෙඳ බලපත්‍ර ලබා දීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | වර්තමානයේ කාර්යාල නිලධාරීන් විසින් ජංගම සේවාවන් මගින් මෙම මෙහෙයුම් සිදු කරමින් පවතින බව. | අතුරු ව්‍යවස්ථා අනුව වෙළෙඳ බලපත්‍ර නිකුත් කර ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ගාස්තු රු.8,385,400ක් සහ මුද්දර ගාස්තු රු.1,583,267 ක් විය. | හිඟ හිටි මුදල් අය කිරීමට පියවර ගෙන ඇති බව. | අය කළ යුතු ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහනගර සභා දෙකක සහ ප්‍රාදේශීය සභා 04 ක ඝන අපද්‍රව්‍ය ලබා ගන්නා සභාවේ ප්‍රධාන ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ තිබූ කිරුම් උපකරණ වර්ෂ තුනකට පෙර සිට අකුණු සැර වැදීමෙන් හානි වී තිබූ අතර ඒවා පිළිසකර කිරීමටත් ඉදිරි අනාගතයේ අකුණු සැරවලින් ආරක්ෂා කිරීමටත් සභාව විසින් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් ආසන්න ඇස්තමේන්තු මත කිරුම් කටයුතු සිදුකර ගාස්තු අයකර තිබුණි. මේ නිසා සභාවට ලැබිය යුතු තථ්‍ය ආදායම අහිමි වී තිබුණි. | දෝෂ සහිත කිරුම් උපකරණ අලුත්වැඩියා කිරීමට පියවර ගනිමින් සිටින බව. | කිරුම් උපකරණ කඩිනමින් අළුත්වැඩියා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | වර්ෂ හතරකට අධික කාලයක සිට අක්‍රීයව පැවැතුණු එකතුව රු.1,293,948 ක් වූ බැංකු ජංගම ගිණුම් දෙකක ශේෂ ඵලදායී ලෙස යොදා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි. | ආදායම් ඉපැයීමේ මූලාශ්‍රයන්හි යෙදවීමට පියවර ගන්නා බව. | ජංගම ගිණුම් ශේෂ ඵලදායී ලෙස යොදා ගත යුතුය. |
| (ඇ) | ඉඩම් 33 ක් සහ වාහන 31 ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කිරීමට පියවර ගන්නා බව. | වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීම කඩිනම් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා සභා බලප්‍රදේශවල අයත් ප්‍රතිලාභීන් 386 දෙනෙකු විසින් කැපූ කොන්ක්‍රීට් සහ තාර මාර්ග | මාර්ග අලුත්වැඩියා කිරීමට කටයුතු කර තැන්පත් මුදල් ප්‍රතිලාභීන් වෙත ආපසු ලබාදීමට පියවර ගන්නා බව. | ජල සම්බන්ධතාව ලබාගැනීමට කැපූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තැන්පතුවක් ලෙස රු. 810,000ක් අයකර තිබුණි. එම මාර්ග විගණන දිනය වන විටත්, ප්‍රතිලාභීන් ලවා නැවත පිළිසකර කරවා තැන්පත් මුදල් ආපසු ගෙවීමට හෝ එම අරමුදලින් ප්‍රතිසංවිධානය කිරීමට හෝ සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | | |
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05ක් ඉක්ම ගොස් තිබූ රු. 957,996ක් වූ සණ අපද්‍රව්‍ය ගොඩකිරීමේ හිඟ මුදල් කාරෙයිතීවු ප්‍රාදේශීය සභාවෙන් නීතිමය ක්‍රියාමාර්ග මගින් අයකර ගැනීමට 2019 වර්ෂයේ පැවති මහා සභා රැස්වීමේදී තීරණය කළද, 2022 දෙසැම්බර් 31 වන දින දක්වා හිඟ මුදල් නීතිමය ක්‍රියාමාර්ග මගින් හෝ එම සභාවේ මූල්‍ය තත්ත්වය අනුව හෝ අර්ධ වශයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර නොගත් හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට පියවර ගන්නා බව. | අය කර නොගත් හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

**3.2 නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලබා දුන් රු. 1,400,000 ක අරමුදල් යොදවා පල්ලක්කාඩු ගම්මානයේ ඉදි කරනු ලැබූ සත්ත්ව අස්ථි ඇඹරුම් කම්හල භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් ඉදිකර අදාල ආයතනයට දැනුම් දුන්නද මෙතෙක් විධිමත් එකඟතාවකට පැමිණ නොමැති බව. | සත්ව අස්ථි ඇඹරුම් මධ්‍යස්ථානය ඉතා ඉක්මනින් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වාහන 13ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන අලුත්වැඩියා කිරීමට සහ වෙන්දේසියේ විකිණීමට කටයුතු කර ඇති බව. | වාහන අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කළ යුතුය. |
| (ආ) | අඩ්ඩාලච්චේන සහ පාලමුණේ ළමා ක්‍රීඩා උද්‍යානයේ තිබූ ඇතැම් ක්‍රීඩා උපකරණවලට ප්‍රමාණවත් ආරක්ෂාවක්, නඩත්තුවක් සහ අලුත්වැඩියාවක් නොමැතිවීම හේතුවෙන් ඇතැම් ඒවා හානි වී මලකඩ කෑමට ලක්වී තිබුණි. ඒවා ආරක්ෂා කිරීමට සභාව නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා ඉදිරියේදී ඒවා | වර්තමානයේ අළුත්වැඩියා කිරිමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | ක්‍රීඩා උද්‍යානයේ ප්‍රමාණවත් නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුළුමනින්ම විනාශවී යාමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හා වෙනත් අමාත්‍යාංශවලින් පරිත්‍යාග ලැබූ වාහන 07ක හිමිකාරිත්වය සභාවේ නමට මාරුකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙන නොතිබුණි. | ඉහත වාහන සඳහා විශාල ප්‍රමාණයක රේගු බදු ගෙවිය යුතු බැවින් හිමිකාරිත්වය මාරු කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇති බව. | වාහනවල හිමිකාරිත්වය සභාවේ නමට මාරුකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභාව විසින් ප්‍රසම්පාදන සැළැස්මකින් තොරව විටින් විටභාණ්ඩ මිලදී ගැනීම හේතුවෙන් සැපයුම්කරුවන්ට වැඩිපුර රු.243,600ක ගෙවිය යුතුව තිබුණි. | රටෙහි පැවැති අයහපත් වාතාවරණය හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කළ නොහැකි වූ බව. | විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මිය ගිය, විශ්‍රාම ගිය සහ සේවය හැරගිය නිලධාරීන් 07කගෙන් අයකළ යුතු හිඟ ණය ශේෂ රු. 218,772ක් එම පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ සුදුසු තීරණයක් ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ණය අදාල පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ සුදුසු තීරණයක් ගැනීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

**පාරිසරික ගැටළු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ වන රෙගුලාසිවලට අනුව බලපත්‍ර ලබා ගතයුතු කර්මාන්ත ආයතන 100ක් තිබූ නමුත් කර්මාන්ත ආයතන 32ක කල් ඉකුත් වූ බලපත්‍ර අලුත් කිරීමට සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | බලපත්‍ර අලුත් කිරීමේ කටයුතු කඩිනම් කර ඇති බව. | 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ වන රෙගුලාසිවලට අනුව බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කළ යුතුය. |